කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024
2026 ජූලි / අගෝස්තු

මානවශාස්ත්‍ර පීඨය

## සිංහල

නූතන සිංහල සාහිත්‍ය ප්‍රවේශය- SINH 18214

පළමුවන කොටසේ ප්‍රශ්නයත් දෙවන හා තුන්වන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

### 1 කොටස

01. පහත සඳහන් පද්‍ය නිර්මාණය පිළිබඳ විචාරයක් සපයන්න.

රන් හැට්ටය හැඳ,
රන් පටියෙහි
දිග කඩුව බැඳ,
අසු පිට නැගුණු කුමාරයා
ගම් නියම් ගම් රාජධානි
පසු කොට ගියේ ය
පස් වසක් ගමන් කළ ඔහු
විවාහ කොටගත් කුමරිය
ගෙන එන්ට
තව පස් වසක් ගත විය
එවැනි රුවක් නො දිටිමු යි,
ඈ ගෙනා දින
පුර වැස්සෝ කීහ
එදින සවස් කල,
පුර දොර අසලදි
රජ ගෙදර
දොරටුපල්ලාගේ දුව
හදා
කුමරුට හමුවිය
"තී කවුරුදැ"යි,
ඔහු විස්මයෙන් ඇසී ය
"තිගේ වැනි රුවක්
මම කිසි කලක නො දිටිමි"

### II කොටස

02. "නවකතා රචකයා කතාවින්‍යාසය හැසිරවීමෙහි ලා දක්වන සාමර්ථ්‍යය හේතුවෙන් සාර්ථක නිර්මාණයක් බිහිවෙයි." නිදර්ශනාත්මක ව විභාග කරන්න.

03. "අද්‍යතන සිංහල කෙටිකතා රචකයෝ අතිශය ගවේෂණාත්මක නිර්මාණශීලී උපක්‍රම භාවිතයෙන් පාඨක ආකර්ෂණය දිනා ගැනීමට සමත් වෙති." මේ මතයෙහි සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න.

04. ''චරිත තුනක් අවශේෂ සමකාලීන නවකතාවලට සාපේක්ෂව තත්කාලීන ගැමි ජනසංස්කෘතිය අරභයා රචකයා සතු සූක්ෂ්මාවබෝධය මූර්තිමත් කරන්නකි.'' තත් ප්‍රකාශයෙහි නිරවද්‍යතාව සනිදර්ශන ව සනාථ කරන්න.

05. පහත සඳහන් කෙටිකතා අතරින් ඔබට අභිමත එක් කතාවක් පිළිබඳ විචාරයක් සපයන්න.

- අ) කැනල් පාරේ නිසාචරයෝ
- ආ) සාරධාගේ මංගල්‍යය
- ඇ) පෑදි දියට බොරදිය
- ඈ) දඬු ලේනා

## III කොටස

06. නූතන සිංහල කවියේ ආරම්භය කෙරෙහි බලපෑ සමාජ දේශපාලන පසුබිම පිළිබඳ විමසීමක් කරන්න.

07. නිදහස් කාව්‍ය රීතිය ආදේශයත් සමගින් නූතන සිංහල කවියේ උද්ගත නව්‍ය ප්‍රවණතා කවරේදැයි නිදර්ශනාත්මක ව විමර්ශනය කරන්න.

08. නාට්‍යයේ දී සතර අභිනයේ භාවිතය පිළිබඳ විග්‍රහයක් සපයන්න.

09. ''මූලාශ්‍රය අතික්‍රමණය කරමින් නාට්‍යයේ දී මනමේ කුමරියගේ චරිතය ප්‍රතිනිර්මිතය'' මේ පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)

*****************************